# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 112 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 22/01/2024<br>පැය 0800 |

## මාධ්‍ය නිවේදනය

**බෞද්ධ ආගමට නින්දා වන ආකාරයට ප්‍රකාශ හා ක්‍රියා සිදු කරමින් එම වීඩියෝ අන්තර්ජාලයට මුදාහරින ලද චීවරධාරියෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

රත්නපුරේ විමලබුද්ධි නොහොත් විශ්ව බුද්ධි නැමැති චීවරධාරියා විසින් බෞද්ධාගමිකයන්ගේ හැඟීම් වලට රිදවීමේ අරමුණින් බෞද්ධ ආගමට නින්දා වන ආකාරයට ප්‍රකාශ හා ක්‍රියා සිදු කරමින් විවිධ සාකච්ඡා පවත්වමින් එම වීඩියෝ දර්ශන අන්තර්ජාලයට මුදා හැරීම හා ආගමික වෛරය පතුරවමින් එදිරිවාදිකම් වලට පෙළඹවීම සම්බන්ධව ගරුතර ස්වාමීන් වහන්සේලා කිහිප නමකගෙන් පොලිසිය වෙත පැමිණිලි කිහිපයක් ඉදිරිපත් කර තිබුණි.

ඒ අනුව මෙම චීවරධාරියා 2024.01.20 වන දින සවස් කාලයේදී තිහාරිය, කළගෙඩිහේන ප්‍රදේශයේදී සිවිල් ඇඳුමින් සැරසී සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන අංශය විසින් අත්අඩංගුවට ගෙන ඇත. මෙම අය 2024.01.21 වන දින ගංගොඩවිල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2024.01.26 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.